

පළමුවන කලාපය

# තේ තතු

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ උපදෙස් හා ව්‍යාප්ති අංශයේ ප්‍රකාශණයකි

පළවෙනි කාණ්ඩය, පළවෙනි කලාපය 2001 ජනවාරි - ජූනි


## කුඩා තේ වතු සංවර්ධනයට අපේ දායකත්වය

*අධ්‍යක්ෂතුමාගෙන්...*

ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනයට කුඩා තේ වතු හිමියන්ගෙන් ඉටුවන ප්‍රභල දායකත්වය අපි ඉතාමත් ඉහලින් අගය කරන්නෙමු. නමුත්, නව තේ තාක්ෂණය පිළිබඳ ඔවුන්ගේ දැනුම් පවස සංසිඳවීමට අපෙන් ඉටුවන කාර්යය පිළිබඳ ව ප්‍රමාණවත් තරමින් සතුටු වියයුතු අවධියක නොවෙයි අප තවමත් ඉන්නේ. නව දැනුමෙන් ඔවුන් ව ශක්තිමත් කිරීම සඳහා අපට කල හැකි දෑ උපරිම අයුරින් ඉටුකිරීමට අප ඉදිරියේ ඇති නව මංපෙත් ගවේශණය කිරීමටත් ඒවා උපරිම අයුරින් උපයෝගී කර ගැනීමටත් යෝග්‍ය කාලය දැන් එළඹ ඇති බව පැහැදිලිය. එවන් කාර්යයන් ඉටුකිරීම සඳහා අපගේ කාලයෙන් සැලකියයුතු ප්‍රමාණයක් වෙන්කර ඇති බව සඳහන් කරන්නේ ඉතාමත් සංතෝෂයෙනි.

අපගේ විද්‍යාඥයින් සහ උපදෙස් හා ව්‍යාප්ති අංශයේ නිලධාරී මණ්ඩලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නියෝජිත මහත්වරුන් සමග එක්ව ගොඩනගාගත් - තේ පර්යේෂණායතන හා කුඩා තේ වතු සංවර්ධන අධිකාරී අන්තර් ක්‍රියාකාරකම් විමර්ශණ කමිටුව - එහි එක් මුල් පියවරක්.

මෙතෙක් කලක් විශාල පරිමාණයේ වතු ක්ෂේත්‍රයේ නියෝජිතයන් සමග පමණක් පවත්වාගෙන ආ පර්යේෂණ සහ ව්‍යාප්ති සංසඳ සම්මන්ත්‍රණ මාලාවන්, 1997 වසරේ සිට කුඩා තේ වතු ක්ෂේත්‍රය නියෝජනය කරන්නන් සමග ද පවත්වා ගෙන යාම අපගේ තවත් වැදගත් පියවරක්. මෙවන් අවස්ථා වලදී කුඩා තේ වතු හිමියන්ට සහ එම ක්ෂේත්‍රය නියෝජනය කරන්නන් හට අපගේ විද්‍යාඥයින් සමග සෘජු සංවාදයන්ට එළඹීමට හැකිවීම වැදගත් කරුණක් වෙනවා.



අපේ රටේ ජනතාවගේ සමස්ථ සාක්ශරතා ඥාණය සැලකියයුතු ඉහල මට්ටමක පවතින නිසා, තාක්ෂණික හා විද්‍යාත්මක දැනුම බෙදාදීමේ ලා මුද්‍රිත මාධ්‍යයයන්ට කලහැකි කාර්යභාරය ඉතාමත් ඉහලය. එමනිසා කුඩා තේ වතු ක්ෂේත්‍රයේ නියලෙන්නන් වෙනුවෙන් අප විසින් පිළියෙල කර ඇති තාක්ෂණික පත්‍රිකා සහ පොත්පත් අතරට මෙවන් ද්වි වාර්ෂික තොරතුරු පුවත්පතක් ගෙන ඒමේ කර්තව්‍යයට මට ද දායක වීමට අවස්ථාව ලැබීම ඉතාමත් විශාල භාග්‍යයක් ලෙස මා සලකනවා.

මෙවන් තොරතුරු පත්‍රිකාවක්, නිරන්තරයෙන් දියුණුවන තේ ක්ෂේත්‍රයේ තාක්ෂණික ඥාණය අඩුම කාලයක් තුලදී කුඩා තේ වතු ක්ෂේත්‍රයේ නියලෙන්නන් වෙතට ගෙන යාමට ප්‍රබල පිටුවහලක් වන බව මගේ විශ්වාසයයි.

**ආචාර්ය ඩබ්.ඩබ්.ඩී මොඩර්**